# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## බෙදුම් නඩු (සංශෝධන)

**ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 21 දරන බෙදුම් නඩු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා විසින් 2023 මාර්තු මස 23 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2023 පෙබරවාරි මස 23 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[168 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල : රු. 25.00 තැපැල් ගාස්තුව : රු. 150.00

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## නීතිය බලපෑමේ ප්‍රකාශය

*2 වන වගන්තිය* : මේ වගන්තිය මගින් (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 21 දරන බෙදුම් නඩු පනතට 2අ වන වගන්තිය අලුතින් ඇතුළත් කරනු ලැබේ. අලුත් වගන්තිය මගින් පත්සල් ඉඩමක ප්‍රවේණි පංගුවක ප්‍රවේණි නිලකාරයාට හෝ ප්‍රවේණි නිලකාරයකුගෙන් හිමිකම ලබාගන්නා යම් පුද්ගලයකුට එකී ප්‍රවේණි පංගුව බෙදා වෙන් කිරීමක් හෝ විකිණීමක් සඳහා බෙදුම් නඩුවක් පැවරීමේ හැකියාව ඇති කරවනු ලැබේ.

*3 වන වගන්තිය* : මේ වගන්තිය මගින් බෙදීමට නියමිත ඉඩමට සම්බන්ධතාවක් ඇති සියලු පුද්ගලයන්ට එකී බෙදුම් නඩුව පිළිබඳ දැනුවත් වීම සඳහා බෙදුම් නඩුව පිළිබඳ කරුණු බැනරයක ප්‍රදර්ශනය කිරීම ද ශබ්ද විකාශන යන්ත්‍රයක් භාවිතයෙන් ප්‍රසිද්ධ නිවේදනයක් සිදු කිරීම ද සඳහා විධිවිධාන සකසමින් ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

*4 වන වගන්තිය* : මේ වගන්තිය මගින් නඩුව විමසීම සඳහා අධිකරණයේ මෙහෙයවීම මත හෝ නැතහොත් නඩුවේ යම් පාර්ශ්වකරුවකුගේ වුවමනාව මත, 73 වන වගන්තියේ සඳහන් කර ඇති යම් මිනින්දෝරුවරයකුට වැඩිදුරටත් වූ අධිකාර පත්‍ර නිකුත් කිරීම සඳහා අධිකරණයට හැකියාව ඇති කරවමින් ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

*5 වන වගන්තිය* : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට 17 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එය ඉහත 3 වන වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තියට සිදු කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

*6 වන වගන්තිය* : මේ වගන්තිය මගින් නඩුව විභාග කිරීමට නියමිත පළමු දිනයට පසුව මැදිහත් වන පාර්ශ්වයකට ලේඛනවල ලැයිස්තුවක් ඉදිරිපත් කිරීම සඳහා කාලසීමාවක් ලබා දෙමින් ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

*7 වන වගන්තිය* : මේ වගන්තිය මගින් මුල් මැනීම සිදු කරන ලද මිනින්දෝරුවරයා වෙත හෝ 73 වන වගන්තියේ දක්වා ඇති ලැයිස්තුවේ නම සඳහන් යම් මිනින්දෝරුවරයකු වෙත හෝ ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය යටතේ මුල් තීන්දු ප්‍රකාශය මගින් යම් අයිතියක් ප්‍රදානය කරනු ලැබ ඇති සියලු පාර්ශ්වයන්ගේ එකඟතාව මත වෙනත් යම් මිනින්දෝරුවරයකු වෙත ඉඩම කැබලිවලට බෙදා වෙන් කිරීම සඳහා අධිකාර පත්‍රයක් නිකුත් කිරීමට අධිකරණයට හැකියාව ඇති කරවමින් ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

*8 වන වගන්තිය* : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එය ඉහත 3 වන වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තියට සිදු කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

*9 වන වගන්තිය* : මේ වගන්තිය මගින් 36 වන වගන්තිය යටතේ සිදු කරන ලද ආඥාවකින් අතෘප්තියට පත් යම් පුද්ගලයකුහට එකී ආඥාවට එරෙහිව අභියාචනය කිරීමට අවසර ලබා ගැනීම සඳහා වන ඉල්ලීමක් අභියාචනාධිකරණය වෙත ඉදිරිපත් කිරීමට සලස්වමින් ප්‍රධාන ප්‍රඥප්තියේ 36අ වන වගන්තිය ප්‍රතියෝජනය කරනු ලැබේ.

*10 වන වගන්තිය* : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 45අ වන වගන්තියේ 36අ සහ 45අ වගන්ති ලෙස වැරදි සහගත ලෙස කරන ලද සඳහන් කිරීම මගින් එම වගන්තියේ සිදු වූ දෝෂ නිවැරදි කරමින් එම වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

*11 වන වගන්තිය* : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 48 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එය මෙහි ඉහත 2 වන වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට සිදු කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

***12 වන වගන්තිය* :** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 57 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එය මෙහි ඉහත 3 වන වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තියට කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

***13 වන වගන්තිය* :** මේ වගන්තිය මගින් "ප්‍රවේණි නිලකාරයා", "ප්‍රවේණි පංගුව", "පන්සල" සහ " භාරකාරයා" යන යෙදුම්වල අර්ථ නිරූපණ ඇතුළත් කරමින් ප්‍රධාන ප්‍රඥප්තියේ 83 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එය මෙහි ඉහත 2 වන වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට සිදු කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

***14 වන වගන්තිය* :** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනයේ "ග්‍රාම නිලධරයාගේ වාර්තාව" යන ශීර්ෂයෙන් යුත් ආකෘතිය සංශෝධනය කරනු ලබන අතර, එය මෙහි ඉහත 3 වන වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තියට සිදු කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

එල්.ඩී.-ඕ. 68/2021

## ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 21 දරන බෙදුම් නඩු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය

**1.** මේ පනත 2023 අංක    දරන බෙදුම් නඩු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 21 දරන පනතට 2අ වන වගන්තිය ඇතුළත් කිරීම

**2.** (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 21 දරන බෙදුම් නඩු පනතේ 2 වන වගන්තියට ඉක්බිතිව ම, 2අ වන වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු, පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කිරීමෙන් ඒ ප්‍රධාන ප්‍රඥප්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"ප්‍රවේණි නිලකාරයකු විසින් බෙදුම් නඩුවක් පැවරීම

2අ. (1) පන්සල් ඉඩමක ප්‍රවේණි පංගුවක, සෑම ප්‍රවේණි නිලකාරයකු ම හෝ යම් ප්‍රවේණි නිලකාරයකුගෙන් හිමිකම ලබාගන්නා යම් පුද්ගලයකු මේ නීතියේ විධිවිධානවලට අනුකූලව එකී ප්‍රවේණි පංගුව බෙදා වෙන් කිරීමක් හෝ විකිණීමක් සඳහා බෙදුම් නඩුවක් පැවරීමට හිමිකම් ලැබිය යුතු ය.

(2) ප්‍රවේණි පංගුවකට එක් ප්‍රවේණි නිලකාරයකුට වඩා වැඩියෙන් සිටින අවස්ථාවක හෝ ප්‍රවේණි පංගුවකට සම්බන්ධතාවක් දක්වන එක් පුද්ගලයකුට වඩා වැඩියෙන් සිටින අවස්ථාවක, (1) වන උපවගන්තිය යටතේ පවරනු ලබන යම් නඩුවක එකී ප්‍රවේණි නිලකාරයන් හෝ එකී පුද්ගලයන් පාර්ශ්වකරුවන් කළ හැකි ය.

(3) (අ) අවස්ථාවෝචිත පරිදි, ප්‍රවේණි පංගුවක සමස්තය හෝ එහි කොටසක් හෝ සම්බන්ධයෙන් බෙදා වෙන් කිරීමක් හෝ විකිණීමක් සිදු වී නොමැති සේ, ප්‍රවේණි පංගුවක බෙදා වෙන් කිරීමක් හෝ විකිණීමක් (467 වන අධිකාරය වූ) සේවා භුක්ති ආඥාපනතේ විධිවිධාන යටතේ බලාත්මක වන පන්සලක යම් අයිතිවාසිකමක් සඳහා බලපෑමක් ඇති

නොවිය යුතු බව සහ අවස්ථාවෝචිත පරිදි පන්සලකට, එහි භාරකරු හෝ විහාරාධිපති හරහා එකී ආඥාපනත යටතේ අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීමට හිමිකම තිබිය යුතු බව සැක දුරු කිරීම සඳහා මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

(ආ) (467 වන අධිකාරය වූ) සේවා බුත්ති ආඥාපනත යටතේ බලාත්මක වන පන්සලක යම් අයිතිවාසිකමකට, එකී පන්සලේ භාරකරු හෝ විහාරාධිපති මෙම වගන්තියේ විධිවිධාන යටතේ පවරන ලද බෙදුම් නඩුවක පාර්ශ්වකරුවකු කිරීම හෝ නොකිරීම යන කරුණ මත බලපෑමක් ඇති නොවිය යුතු ය.

(4) (අ) අවස්ථාවෝචිත පරිදි, (318 වන අධිකාරය වූ) බෞද්ධ විහාර දේවාලගම් ආඥාපනතේ විධිවිධාන යටතේ (1) වන උපවගන්තියේ සඳහන් කරනු ලබන පන්සලක් සම්බන්ධයෙන් පත් කරන ලද භාරකරුවකුට හෝ (318 වන අධිකාරය වූ) බෞද්ධ විහාර දේවාලගම් ආඥාපනතේ 4(1) වන වගන්තියේ විධිවිධාන යටතේ බැහැර කරන ලද පන්සලක විහාරාධිපතිවරයකුට (1) වන උපවගන්තිය යටතේ පවරන ලද බෙදුම් නඩුවේ පාර්ශ්වකරුවකු වීම සඳහා ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(ආ) අවස්ථාවෝචිත පරිදි, එකී භාරකරු හෝ විහාරාධිපති විසින් මේ උපවගන්තියේ (අ) ඡේදය යටතේ ඉල්ලීමක් සිදු කරන අවස්ථාවක දී, අධිකරණය විසින් එකී භාරකරු හෝ විහාරාධිපති එකී නඩුවේ පාර්ශ්වකරුවකු කළ යුතු ය.".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) ඒ වගන්තියේ (2) වන සහ (3) වන උපවගන්ති ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්ති ආදේශ කිරීමෙන්:-

"(2) එම දැන්වීමේ පිටපතක් සහ එහි පරිවර්තනයේ පිටපතක් මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ ලියාපදිංචි කළ තැපෑලෙන් යම් ග්‍රාම නිලධාරිවරයකු වෙත

යවනු ලැබුවේ ද, ඒ සෑම ග්‍රාම නිලධාරිවරයකු විසින් ම, අවස්ථාවෝචිත පරිදි, ඉඩමේ හෝ ඉඩම්වල උපලේඛනය ද ඇතුළුව දැන්වීමේ ඇතුළත් කාරණා බැනරයක දක්වමින්, ඔහුගේ කාර්යාලයේ හෝ කාර්යාලය අසල, ප්‍රකට ස්ථානයක, නියෝග මගින් නියම කරනු ලබන ආකාරයට, දින තිහකට නොඅඩු කාලසීමාවක් ප්‍රදර්ශනය කර තැබීමට සැලැස්විය යුතු අතර, එසේ ප්‍රදර්ශනය කළ බවට දෙවන උපලේඛනයේ දක්වා ඇති ආකෘතියට සාරානුකූල වූ වාර්තාවක් අධිකරණය වෙත ඉදිරිපත් කළ යුතු ය.

(3) මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ ග්‍රාම නිලධාරිවරයා වෙත එවන ලද දැන්වීමේ ඇතුළත් කාරණා, ග්‍රාම නිලධාරිවරයා විසින් අවස්ථාවෝචිත පරිදි, ඉඩමේ හෝ ඉඩම්වල උපලේඛනය ද ඇතුළුව,-

(අ) නියෝග මගින් නියම කරනු ලබන ආකාරවලට, අවස්ථාවෝචිත පරිදි, ඉඩමේ හෝ ඉඩම්වල ප්‍රකට ස්ථානයක බැනරයක ප්‍රදර්ශනය කිරීමට; සහ

(ආ) අවස්ථාවෝචිත පරිදි, එකී ඉඩමේ හෝ එකී එක් එක් ඉඩමේ සහ එකී ඉඩම හෝ එකී එක් එක් ඉඩමට නුදුරු යම් පොදු ස්ථානයක, ශබ්ද විකාශන යන්ත්‍රයක් භාවිතයෙන් කරන ලද ප්‍රසිද්ධ නිවේදනයක් මාර්ගයෙන් වාචිකව ප්‍රකාශ කිරීමට,

සැලැස්විය යුතු අතර, එසේ සිදුකළ බවට දෙවන උපලේඛනයේ දක්වා ඇති ආකෘතියට සාරානුකූලව වූ වාර්තාවක් අධිකරණය වෙත ඉදිරිපත් කළ යුතු ය.";

(2) ඒ වගන්තියේ අවසානයට පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන්:-

"(4) මේ වගන්තියේ (2) වන සහ (3) වන උපවගන්ති යටතේ සිදු කරන ලද පළකිරීමේ වියදම, පළමුකොට පැමිණිලිකරු විසින් දැරිය යුතු අතර එය ප්‍රමාණුකූල ව අයකර ගත යුතු ය. ග්‍රාම නිලධාරිවරයා විසින්, මේ වගන්තියේ (2) වන සහ (3) වන උපවගන්තිවල සඳහන් කර ඇති පළකිරීම් ක්‍රියාත්මක කිරීම තහවුරු කරමින් කරන ලද දිවුරුම් ප්‍රකාශයක්, මේ වගන්තියේ (2) වන සහ (3)

වන උපවගන්තිවල දක්වා ඇති වාර්තා සමග එකී දැන්වීම ලැබුණු දින සිට මාස දෙකක් ඇතුළත අධිකරණය වෙත ඉදිරිපත් කළ යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය සංශෝධනය කිරීම

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

“(2) (අ) මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ මිනින්දෝරුවරයකු වෙත නිකුත් කරනු ලබන අධිකාර පත්‍රය දෙවන උපලේඛනයේ දක්වා ඇති ආකෘතියට සාරානුකූල විය යුතු අතර, එයට පැමිණිලිකරුගේ ලේඛනගත නීතිඥවරයා විසින් සත්‍ය පිටපතක් බවට සහතික කරන ලද පැමිණිල්ලේ පිටපතක් අමුණා තිබිය යුතු ය.

(ආ) (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද අධිකාර පත්‍රය ක්‍රියාත්මක කිරීමේ දී මිනින්දෝරුවරයා විසින් සකස් කරන ලද පිඹුර 18 වන වගන්තිය යටතේ අධිකරණය වෙත යැවීමේ දී, අධිකරණය විසින්-

(i) (1) වන උපවගන්තියේ සඳහන් කරන ලද මිනින්දෝරුවරයකු වෙත හෝ 73 වන වගන්තියේ සඳහන් කරන ලද මිනින්දෝරුවරයන්ගේ ලැයිස්තුවේ නිශ්චිතව නම දක්වා ඇති වෙනත් යම් මිනින්දෝරුවරයකු වෙත, (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද අධිකාර පත්‍රය යටතේ මනින ලද ඉඩමක යම් විශාල හෝ කුඩා බිම් කොටසක් මැනීමට; හෝ

(ii) (1) වන උපවගන්තියේ සඳහන් කරන ලද මිනින්දෝරුවරයා හැර 73 වන වගන්තියේ සඳහන් කරන ලද මිනින්දෝරුවරයන්ගේ ලැයිස්තුවේ නිශ්චිතව නම දක්වා ඇති වෙනත් යම් මිනින්දෝරුවරයකු වෙත (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද අධිකාර පත්‍රය යටතේ මනින ලද ඉඩම නැවත මැනීමට,

බලය ලබා දෙමින්, අධිකරණයේ මෙහෙයවීම මත හෝ නඩුවේ යම් පාර්ශ්වකරුවකුගේ වුවමනාව මත වැඩිදුරටත් වූ අධිකාර පත්‍රයක් නිකුත් කිරීමට නියම කළ හැකි අතර, අධිකරණය විසින් (1) වන උපවගන්තිය යටතේ නිකුත්

කරන ලද අධිකාර පත්‍රය ක්‍රියාත්මක කිරීමේ දී සකසන ලද පිඹුර මත වැඩිදුරටත් වූ අධිකාර පත්‍රය යටතේ සකසන ලද පිඹුර අධිස්ථාපනය කිරීමට හෝ නඩුව විමසීම සඳහා අත්‍යවශ්‍ය වෙනත් යම් සමාන කාරණයක් ක්‍රියාත්මක කිරීම සඳහා, වැඩිදුරටත් වූ අධිකාර පත්‍රය ක්‍රියාත්මක කරනු ලබන මිනින්දෝරුවරයා හට නියම කරනු ලැබිය හැකි ය.

(ඇ) (ආ) ඡේදයේ සඳහන් කර ඇති වැඩිදුරටත් වූ අධිකාර පත්‍රය ක්‍රියාත්මක කිරීමේ දී, ඒ සම්බන්ධයෙන් මේ උපවගන්තියේ (අ) ඡේදයේ විධිවිධාන, මේ වගන්තියේ (1), (3), (4), (5) සහ (6) වන උපවගන්තිවල විධිවිධාන සහ 17 සහ 18 වන වගන්තිවල විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ කරගත යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය සංශෝධනය කිරීම

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තියේ (2) වන උපවගන්තියේ "අණබෙර ගසා," යන වචන වෙනුවට "ශබ්ද විකාශන යන්ත්‍රයක් භාවිතයෙන් කරන ලද ප්‍රසිද්ධ නිවේදනයක මාර්ගයෙන්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය සංශෝධනය කිරීම

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "බෙදුම් නඩුවක සෑම පාර්ශ්වකරුවකු ම විසින්," යන වචන වල සිට "ඉදිරිපත් කිරීමට සැලැස්විය යුතු ය." යන වචන තෙක් ඇති සියලු වචන වෙනුවට පහත දැක්වෙන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ-

"බෙදුම් නඩුවක සෑම පාර්ශ්වකරුවකු ම විසින්, ඒ ඉඩමෙහි තමාට ඇති අයිතිය, ඒ ඉඩමෙන් තමාට අයිති කොටස හෝ ඒ ඉඩමට ඇති තම සම්බන්ධතාව ඔප්පු කිරීමට තමා උපයෝගි කොට ගන්නා ලේඛනවල ලැයිස්තුවක්, ඒ ලේඛනවල ඇතුළත් කරුණුවල සංක්ෂිප්තයක් ද සමඟ, ඒ නඩුව විභාග කිරීමට නියමිත පළමු දිනයට දින තිහකට නොඅඩු කාලයකට පෙර, අධිකරණයට ඉදිරිපත් කළ යුතු ය; නැතහොත් ඉදිරිපත් කිරීමට සැලැස්විය යුතු ය. නඩුව විභාග කිරීමට නියමිත පළමු දිනයට පසුව මැදිහත් වීමට යම් පාර්ශ්වයකට අවසර දී ඇති අවස්ථාවක, එම පාර්ශ්වය විසින් එකී මැදිහත් වීමේ සිට දින තිහක් ඇතුළත ලේඛනවල ලැයිස්තුවක් ඉදිරිපත් කළ යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය සංශෝධනය කිරීම

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තියේ (3) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(3) ඉඩම හෝ එහි යම් කොටසක් බෙදා වෙන් කළ යුතු යැයි අධිකරණය විසින් තීරණය කරනු ලබන අවස්ථාවක, මේ වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ වූ අධිකාර පත්‍රය 73 වන වගන්තියේ සඳහන් කරන ලද ලැයිස්තුවේ නිශ්චිතව නම දක්වා ඇති යම් වෙනත් මිනින්දෝරුවරයකු වෙත හෝ, 73 වන වගන්තියේ පටහැනිව කුමක් සඳහන් වුව ද, අධිකරණය විසින් සුදුසු යැයි සලකනු ලබන අවස්ථාවක, 26 වන වගන්තිය යටතේ මුල් තීන්දු ප්‍රකාශය වාර්තාගත කිරීම මගින් යම් අයිතියක් ප්‍රදානය කරනු ලැබ ඇත්තේ යම් පාර්ශ්වකරුවන් වෙත ද, එම සියලු ම පාර්ශ්වකරුවන්ගේ එකඟතාවය මත වෙනත් යම් මිනින්දෝරුවරයකු වෙත හෝ නිකුත් කිරීමට අධිකරණය විසින් තීරණය කළහොත් මිස, ඒ අධිකාර පත්‍රය 17 වන වගන්තිය යටතේ මුල් මිනුම කළ මිනින්දෝරුවරයා වෙත නිකුත් කළ යුතු ය.".

**8.** ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තියේ (3) වන උපවගන්තියේ "අණබෙර ගස්සවා" යන වචන වෙනුවට "ශබ්ද විකාශන යන්ත්‍රයක් භාවිතයෙන් කරන ලද ප්‍රසිද්ධ නිවේදනයක මාර්ගයෙන්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තිය සංශෝධනය කිරීම

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 36අ වන වගන්තිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 36අ වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම

"අභියාචනය කිරීමට අවසර ලබා ගැනීම

36අ. 36 වන වගන්තිය යටතේ අධිකරණය විසින් කරන ලද ආඥාවකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින්, (101 වන අධිකාරය වූ) සිවිල් නඩු විධාන සංග්‍රහයේ 754 වන වගන්තියේ (2) වන උපවගන්තිය ප්‍රකාරව අභියාචනය කිරීමට අවසර ලබාගැනීම සඳහා වන ඉල්ලීමක් අභියාචනාධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.".

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 45අ වන වගන්තියේ (2) වන උපවගන්තියේ "36අ සහ 45අ වගන්ති යටතේ" යන වචන වෙනුවට "36 වන සහ 45 වන වගන්ති යටතේ" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 45අ වන වගන්තිය සංශෝධනය කිරීම

ප්‍රධාන ප්‍රඥප්තියේ 48 වන වගන්තිය සංශෝධනය කිරීම

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 48 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "සුළු බද්දක් හෝ මාසයකට නොවැඩි කාලයක් සඳහා වූ බද්දක් ද" යන වචන වෙනුවට "සුළු බද්දක් හෝ මාසයකට නොවැඩි කාලයක් සඳහා වූ බද්දක් හෝ (467 වන අධිකාරය වූ) සේවා බුත්ති ආඥාපනත යටතේ බලාත්මක කරනු ලැබිය හැකි පන්සලක අයිතිවාසිකම්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 57 වන වගන්තිය සංශෝධනය කිරීම

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ 57 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(ඇ) 15 වන වගන්තිය යටතේ බැනරය ප්‍රදර්ශනය කිරීමේ දී සහ ප්‍රකාශනයේ දී දරන ලද ගාස්තු සහ 17 වන වගන්තිය යටතේ සිදු කරන ලද ප්‍රකාශනයේ දී දරන ලද ගාස්තු;".

ප්‍රධාන ප්‍රඥප්තියේ 83 වන වගන්තිය සංශෝධනය කිරීම

**13.** ප්‍රධාන ප්‍රඥප්තියේ 83 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) "ඉඩම" යන යෙදුමේ අර්ථ නිරූපණයේ "ඉඩම හෝ ඉඩම් අදහස් වේ;" යන වචන වෙනුවට "ඉඩම හෝ ඉඩම් අදහස් වන අතර 2අ වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති පරිදි පන්සල් ඉඩමක ප්‍රවේණි පංගුව ද එයට ඇතුළත් විය යුතු ය;" යන වචන ආදේශ කිරීමෙන්;

(2) "බෙදුම් නඩුව" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථ නිරූපණ ඇතුළත් කිරීමෙන්:-

""ප්‍රවේණි නිලකාරයා" යන්නට, එය පන්සලකට සම්බන්ධ වනතාක් (467 වන අධිකාරය වූ), සේවා බුත්ති ආඥාපනතේ 2 වන වගන්තිය යටතේ එයට පවරනු ලැබ ඇති අර්ථය ම තිබිය යුතු ය;

"ප්‍රවේණි පංගුව" යන්නට, (467 වන අධිකාරය වූ) සේවා බුත්ති ආඥාපනතේ 15 වන වගන්තිය යටතේ වන සේවා වෙනුවට න්‍යායදිෂ්ට ගාස්තු සඳහා ආඥාවක් සිදු කරනු ලැබ ඇති (318 වන අධිකාරය වූ) බෞද්ධ විහාර

දේවාලගම් ආඥාපනතේ 2 වන වගන්තියේ අර්ථ නිරූපණය කර ඇති පරිදි වූ පන්සලකට යම් සේවාවක් ඉටු කිරීමකට හෝ රාජකාරී කිරීමකට යටත්ව එක් තැනැත්තකු හෝ ඊට වැඩි ප්‍රමාණයක් විසින් සතු කරගෙන ඇති යම් ඉඩමක් හෝ යම් ඉඩමක කොටසක් ඇතුළත් විය යුතු අතර, එය පන්සලක් සම්බන්ධයෙන් වන තාක් (467 වන අධිකාරය වූ) සේවා බුත්ති ආඥාපනතේ 2 වන වගන්තියෙන් එයට පවරන ලද අර්ථයම ඇතුළත් විය යුතු ය;";

(3) "මිනින්දෝරුවරයා" යන යෙදුමේ අර්ථ නිරූපණයේ "අදහස් වේ;" යන වචන වෙනුවට "අදහස් වේ;" යන වචන ආදේශ කිරීමෙන්;

(4) "මිනින්දෝරුවරයා" යන්නෙහි අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථනිරූපණ ඇතුළත් කිරීමෙන්:-

""පන්සල" යන්නට, එකී පන්සල (467 වන අධිකාරය වූ) සේවා බුත්ති ආඥාපනත යටතේ නිශ්චිතව දක්වා ඇති පරිදි අයිතිවාසිකම් භුක්ති විඳින තාක් (318 වන අධිකාරය වූ) බෞද්ධ විහාර දේවාලගම් ආඥාපනතේ 2 වන වගන්තියෙන් පවරන ලද අර්ථය ම තිබිය යුතු ය; සහ

"භාරකාරයා" යන්නට, (318 වන අධිකාරය වූ) බෞද්ධ විහාර දේවාලගම් ආඥාපනතේ 2 වන වගන්තියෙන් එයට පවරන ලද අර්ථය ම තිබිය යුතු ය.".

**14.** ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනයේ 15 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ නියමිත "ග්‍රාම නිලධරයාගේ වාර්තාව" යන ශීර්ෂයෙන් යුත් ආකෘතිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය සංශෝධනය කිරීම

(1) "(15 (2) වන වගන්තිය)" යන වචන සහ ඉලක්කම් වෙනුවට "(15 වන වගන්තියේ (2) වන සහ (3) වන උපවගන්ති)" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(2) "මීට යා කොට ඇති දැන්වීම් (පරිවර්තන සමඟ) 19 ..... දින සිට 19 .... දින දක්වා මාගේ කාර්යාලයේ දැන්වීම් පුවරුවේ ප්‍රදර්ශනය කළ බව අධිකරණය වෙත මෙයින් වාර්තා කරමි." යන වචන සහ ඉලක්කම් වෙනුවට පහත වචන ආදේශ කිරීමෙන්-

> "ඉඩමේ උපලේඛනය ද ඇතුළුව දැන්වීමේ ඇතුළත් කරුණු දක්වන ලද බැනරයක් .... දින සිට .... දින දක්වා මගේ කාර්යාලයේ ප්‍රකට ස්ථානයක සහ ඉඩමේ ප්‍රකට ස්ථානයක ප්‍රදර්ශනය කළ බව සහ එකී ඉඩමේ සහ එකී ඉඩමට නුදුරු යම් පොදු ස්ථානයක ශබ්ද විකාශන යන්ත්‍රයක් භාවිතයෙන් කරන ලද ප්‍රසිද්ධ නිවේදනයක් මාර්ගයෙන් වාචිකව ප්‍රකාශ කළ බව අධිකරණය වෙත මෙයින් වාර්තා කරමි.".

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**15.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.